යටවත්ත ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට යටවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.704,136 ක ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායමක් ගිණුම්ගතකර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් නිවැරැදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2020 වර්ෂයේ නිවැරදි කරමි. |
| (ආ) | සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් වැයකළ රු.1,300,245 ක මුදලක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පර්චස් 15 කින් යුතු ඉඩම් කොටසේ වටිනාකම වූ රු.100,000 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2020 වර්ෂයේ නිවැරදි කරමි. |
| (ඈ) | රු.535,000 ක් වටිනාකමින් යුතු ජල බවුසරයේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ නිවැරදි කරමි. |
| (ඉ) | පමුණුදෙණිය අතුරු මාර්ගය සංවර්ධනය කිරිම වෙනුවෙන් සැලගම ගොවි සංවිධානයට ගෙවිය යුතු රු.200,000 ක මුදල ගිණුම්වලින් අත්හැර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ නිවැරදි කරමි. |
| (ඊ) | රු.343,274 ක නිමි වැඩ වටිනාකම රු.313,274 ක් ලෙස ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කිරීම සඳහා, සමාලෝචිත වර්ෂය තුළ රු.313,274 ක් ගොඩනැඟිලි ගිණුමට නැවත හර කිරීමෙන් ගොඩනැඟිලි වටිනාකම රු.283,274 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ නිවැරදි කරමි. |
| (උ) | මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු ගිණුමකට අදාළව ලැබිය යුතු රු.127,181 ක පොළිය ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2020 වර්ෂයේ නිවැරදි කරමි. |

1.3.2 නොසැසඳුණු ගිණුම්

| නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.54,752,805 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂය සහ ඒවාට අදාළ උපයෝගි ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර, නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.5,949,856 ක් විය. | ගිණුම් ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිරවුල් කිරීමට හැකි ගනුදෙනු නිරවුල් කිරීමටත්, උප ලේඛන නිවැරදි කිරීමටත් කටයුතු කරමි. |

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ලැබිය යුතු ගිණුම් | | |
| වර්ෂ 1 ට වැඩි හා 5 ට අඩු රු.2,460,256 ක් හා වර්ෂ 5 ට වැඩි රු.31,960 ක ලැබිය යුතු ශේෂයන් පැවතුණි. | හිඟහිටි ආදායම් හා ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ආදායම් අයකර ගැනීමටත් දීර්ඝ කාලීනව පවතින හිඟ ශේෂ කපා හැරීමටත් කටයුතු කරමි. |
| (ආ) ගෙවිය යුතු ගිණුම් | | |
| වර්ෂ 1 ට වැඩි හා 5 ට අඩු රු.5,166,910 ක් හා වර්ෂ 5 ට වැඩි රු.86,390 ක ශේෂයෙන් 2020 මැයි 14 දින වන විට රු.38,676 ක ශේෂයක් තවදුරටත් ගෙවිය යුතුව තිබුණි. | නිරවුල් කළ යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී මේ සමබන්ධව කටයුතු කරමි. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

තොරතුරු ඉදිරිපත් නොකිරීම

| නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.63,891,876 ක් වූ ගිණුම් විෂයයන් 3 කට අදාළව සමීක්ෂණ මණ්ඩල වාර්තා හා උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | සමීක්ෂණ මණ්ඩල වාර්තා හා උපලේඛන ඉදිරිපත් කළ යුතු වේ. | නිවැරැදි වාර්තා හා උප ලේඛන ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 24 වගන්තිය | සභාවට අයත් සියළුම මාර්ග ඇතුළත් කර ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ලේඛන යාවත්කාලීන කළ යුතු වේ. | ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | අවස්ථා 9 කට අදාළ රු.192,339 ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | නිදහස් කිරීමට හැකි තැන්පතු නිදහස් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,013,361 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,675,629 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,323,000 | 1,227,578 | 1,046,675 | 181,000 | 1,087,000 | 1,398,987 | 1,272,854 | 199,501 |
| (ii) | කඩ කුලී | 235,000 | 215,050 | 215,050 | - | 1,221,000 | - | 1,020,275 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,075,000 | 911,150 | 911,150 | - | 915,060 | - | 1,039,458 | - |
| (iv) | වෙනත් ආදායම් | 1,000,000 | 1,380,900 | 1,380,900 | - | 5,840,300 | - | 3,274,945 | - |
| | එකතුව | 3,633,000 | 3,734,678 | 3,553,775 | 181,000 | 9,063,360 | 1,398,987 | 6,607,532 | 199,501 |

### 2.2.2 අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවැති රු.31,960 ක අක්කර බදු මුදලක් අයකරගත යුතුව පැවතුණි. | අයකර ගැනීමට ඇති හැකියාව සලකා බැලිය යුතු වේ. | කපා හැරීමට කටයුතු කරමි. |

### 2.2.3 ජල ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජල ව්‍යාපෘති දෙකකට අදාළ ජල පාරිභෝගිකයින් 129 දෙනෙකුගෙන් 2010 හා 2017 වර්ෂවල සිට හිඟහිටි ජල ගාස්තු රු.98,180 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ මුදල් අයකර ගත යුතු වේ. | කපා හැරීමට කටයුතු කරමින් පවතී. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,993,189 ක් සහ මුද්දර ගාස්තු රු.2,667,906 ක් පැවති අතර, 2020 මැයි 12 දින වන විට පිළිවෙළින් රු.1,831,188 ක් හා රු.783,500 ක් තව දුරටත් අය විය යුතුව තිබුණි. | ලැබිය යුතු ආදායම් අයකර ගත යුතු වේ. | අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.5 අධිභාර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂවලදී පැනවූ අධිභාරවලට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.32,259 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙතෙක් අයවී නොමැති බව සඳහන් කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අතුරු ව්‍යවස්ථා 3 ක් පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කසළ බැහැර කරනු ලබන ඉඩම ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, කසළ ව්‍යාපෘතිය සඳහා පරිසර බලපත්‍රය ලබා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. එසේම දිරන කසළ භාවිතා කර කාබනික පොහොර නිෂ්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | අදාළ ඉඩම පවරාගෙන පරිසර බලපත්‍රය ලබා ගැනීමටත්, නොදිරන කසළ අලෙවි කිරීමට හා ප්‍රතිචක්‍රීකරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | කසළ බැහැර කරන ඉඩම පවරා ගැනීමට කටයුතු කරමින් පවතින අතර, එතෙක් පරිසර බලපත්‍රය ලබාගත නොහැකි බව දන්වා සිටිමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/SP/SDG/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම පිළිබඳව විධිමත් සැළැස්මක් පිළියෙල කර නොතිබුණි. එසේ තිබියදී අයවැය ලේඛනයේ තිරසර සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් රු.386,000 ක් වෙන්කර ඒ සඳහා රු.191,714 ක් වැයකර තිබූ අතර, මේ යටතේ රු.145,000 ක මුදලක් වෙන්කර තිබූ වැඩසටහන් 4 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිකර තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට නොහැකි විය. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පසුගිය වර්ෂ හතරක් තුළ ගොඩනැගිලි අයදුම්පත්‍ර සඳහා සංවර්ධන බලපත්‍ර 398 ක් නිකුත් කර ඇතත්, අනුකූලතා සහතික 37 ක් පමණක් නිකුත් කර තිබුණි. | අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතු කළ යුතු වේ. | අනුකූලතා සහතික ලබා ගැනීම සඳහා සියලු අයදුම්කරුවන් දැනුවත් කර ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ අනුමත තනතුරු 07 ක පුරප්පාඩු 11 ක් පැවතුණි. | පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුව හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කර ඇත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කසළ වෙන්කර තැබීම සඳහා බෙදා දීමට රු.34,510 කට මිලදීගෙන තිබූ කසළ බඳුන් 109 ක් බෙදා දීමකින් තොරව 2020 මැයි 12 දින වන විටත් සභා භූමියේ රඳවාගෙන තිබුණි. | ප්‍රතිලාභීන් හඳුනාගෙන බෙදාහැරීමට කටයුතු කළ යුතු වේ. | කසළ බඳුන් අදාළ ප්‍රජාව වෙත ඉදිරියේදී ලබාදීමට කටයුතු කරමි. |

3.5 වත්කම් කළමනාකරණය

නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2012 වර්ෂයේ දී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මැදරට පළාත් පාලනයේ තොරතුරු තාක්ෂණය ප්‍රවර්ධන ව්‍යාපෘතිය ඊ-ණැන පියස වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.607,617 ක වටිනාකමින් යුතු පරිගණක සහ උපකරණ ලබාදී තිබුණ ද 2020 මැයි 12 දින දක්වාම එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | ඊ-ණැන පියස කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. | පරිගණක මධ්‍යස්ථානය ආරම්භ කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමුකර ඇත. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

අභ්‍යන්තර විගණනය

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන විෂය භාර නිලධාරිනියට එම කාර්යයන්ට අමතරව විවිධ විෂයානුබද්ධ කාර්යයන් පවරා තිබීම හේතුවෙන් වර්ෂය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට නොහැකි වී තිබූ අතර අභ්‍යන්තර විගණන වාර්තා ද ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කාර්යය පමණක් පැවරීම කළ යුතු වේ. | ප්‍රජා මණ්ඩල පිහිටුවීම හා වත්කම් සමීක්ෂණ කටයුතු පමණක් එම නිලධාරියා වෙත පවරා ඇති බව දන්වා සිටිමි. |